මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණය

මාලිගාකන්ද මහේස්ත්‍රාත් ගරු ලෝචනී අබේවික්‍රම වීරසිංහ මැතිණිය ඉදිරිපිට දීය.

නඩු අංකය :- B/ 6883/24 දිනය :-2024.01.30

ඊ.පී.අයි.කේ. ඇපළතොටුව,
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය.
මරදාන.

- පැමිණිළිකරු -

එදිරිව,

1. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන්
2. පාර්ලිමේන්තු මන්ත්‍රී සජිත් ප්‍රේමදාස,
3. පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බංඩාර
4. පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. මරික්කාර්,
5. පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂිම්,
6. පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා,
7. පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් ෆොන්සේකා,
8. පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ.සී අලවතුවල,
9. පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක,
10. පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂාමන් කිරිඇල්ල,
11. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුජීව සේරසිංහ,
12. පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක අබේසිංහ,
13. ආනන්ද පලිත,
14. පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ,
15. පාර්ලිමේන්තු මන්ත්‍රී කාවින්ද ජයවර්ධන,
16. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු විරෝධතාව සඳහා සහභාගී වන 500කට අධික තවත් අය.

- උත්තරකරුවන් -

CamScanner

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 (2) සහ 106 (3) වගන්තිය සමඟ කියවිය යුතු 106 (1) වගන්තිය යටතේ කරනු ලබන නියෝගය යි.

අද දින මරදාන පොලිස් ස්ථානාධිපතිවරයා විසින් සිදු කරන ලද ඉල්ලීම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 වගන්තිය යටතේ වන අතර, බී වාර්තාවේ සිය අයැදීමට අදාලව දීර්ඝ ලෙස කරුණු වාර්තා කොට ඇත. මරදාන ස්ථානාධිපතිවරයා බී වාර්තාවේ අඩංගු තොරතුරු සමඟ වාචිකව කරුණු දැක්වීමේදී වැඩ බලන පොලිස්පති විසින් ස්ථානාධිපති මරදාන වෙත යොමු කළ බුද්ධි තොරතුරු වාර්තාව X-01 ලෙස අධිකරණයට ලකුණු කරමින් ඉදිරිපත් කොට ඇති අතර, ඒ අනුව සිය අයැදීම මඟින් වග උත්තරකරුවන් 16 දෙනෙක් සහ ඔවුන්ගේ මතධාරීන් 15000 ක පමණ ප්‍රමාණයක් සිටින බවට වාර්තා කරමින් අයැද සිටිනුයේ අදාල වගඋත්තරකරුවන් සමඟින් මතධාරීන් 15,000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහභාගී කරවා ගනිමින් අද දින එනම් 2024.01.30 දින පැය 15.00 ට පමණ විශාල ජනසහභාගිත්වයක් යුතුව විරෝධතාවයක් සූදානම් කර ඇති බවත්, අද දින පැය 15.00 ට පමණ විහාරමහා දේවි උද්‍යානය අසලට රැස්ව උද්ඝෝෂණයක් ආරම්භ කර ලිපිටන් වටරවුම, ඩීන්ස් පාර, ටී.බී ජයා මාවත, මරදාන හංදිය ඔස්සේ එල්පිස්ටන් රඟහල ඉදිරිපිටින් ,ටෙක්නිකල් හංදිය දක්වා පැමිණ ඔල්කට් මාවත ඔස්සේ කොළඹ කොටුව මුදල් අමාත්‍යාංශය දක්වා ද, P.D. සිරිසේන ක්‍රීඩාංගනයේ රැස්වී මරදාන පොලිස් වසමේ පංචිකාවත්ත වටරවුමට, සංඝරාජ මාවත, ටෙක්නිකල් හංදිය ඔස්සේ ඔල්කට් මාවත ඔස්සේ කොළඹ කොටුව මුදල් අමාත්‍යාංශය දක්වා ගමන් කරමින් පා ගමන් පැවැත්වීමට අනිවාර්ය සූදානමක් ඇති බවත්, කොළඹ නගරයේ ප්‍රධාන පිවිසීමේ මාර්ගයක් අහුරාලමින් මාර්ගය අවහිර වන අධික ජන සහබාගිත්වයක් යුතුව උද්ඝෝෂණයක් හා පා ගමනක් පැවැත්වීමට සූදානම් කොට ඇති බවත්, ඒ හේතුවෙන් මාර්ගවල ගමනාගමනය අවහිර වන පරිදි වාහනවලට සහ මහජනතාවට බාධා වන ලෙසට ප්‍රධාන මාර්ගයේ මංතීරු සියල්ල සහ පදික වේදිකාවන් ද අවහිර කරමින් මාර්ගය භාවිතා කරන මහජනතාවට මෙන්ම ආශ්‍රිත ප්‍රධාන රජයේ රෝහල්වල සේවය ලබා ගැනීමට පැමිණෙන සහ සේවය කරන මහජනතාවට පීඩාවක් අවහිරයක්, බාධාවක් ඇතිවන පරිදි ක්‍රියාකරනු ඇති බවත්, අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවාවක් බිඳ වැටීමේ අවධානමක් ඇති බවත්. විරෝධතාකරුවන්ගේ පූර්ව ක්‍රියා කලාපයන් සහ ඒ අනුව ඔවුන්ගේ ඉහතින් දැක්වූ අද දින සැලසුම් සම්බන්ධයෙන් අධිකරණයට නිශ්චිත භාවයකින් යුක්තව සලකා ලබමින් මතයක් ලබා දීමට ද හැකියාවක්

CamScanner

ඇති බවත්, ඒ අනුව ඉතා ආසන්නයේ දී අනිවාර්යයෙන් සිදු වීමට මාර්ගයක් ආශ්‍රිත බාධා අවහිරතා වැළැක්වීමේ ආඥාවක් නිකුත් නොකළහොත් එයින් අද දින සවස් කාලයේ සිය රැකියාවන් අවසන් ව නිවෙස් බලා පිටත් වන සියළු ආකාරයේ රාජ්‍ය නිලධාරීන් සහ වැඩ කරන ජනතාව ද නිරන්තරයෙන් මෙම අධිකරණ බලප්‍රදේශයේ කොළඹ ජාතික රෝහල, ඇස් රෝහල ආශ්‍රිත රෝහල් පද්ධතියේ සේවය ලබා ගැනීමට පැමිණෙන රෝගීන් සහ ඔහුන් බැලීමට පැමිණෙන මහජනතාව ද රෝහල් ආශ්‍රිත සියළු ආකාරයේ සේවක නිලධාරීන් ද ඇතුළු සියළු මහජනතාවයට දැඩි පීඩාවක් ඇති වනු ඇති බවත්, එමෙන් ම අධිකරණ මාවත ආශ්‍රිතව පැන නගින තදබද තත්ත්වයන් හේතුවෙන් අළුත්කඩේ අධිකරණ සංකීර්ණයේ රාජකාරී කටයුතු වලට පැමිණෙන සියළු ආකාරයේ නිලධාරීන් සහ එහි සේවය ලබා ගැනීමට පැමිණෙන මහජනතාව ඇතුළු සවස් කාලයේ අදාල කටයුතු අවසන් වී නිවෙස් බලා යන විශාල ප්‍රමාණයෙන් වන මහජනතාව සහ ප්‍රභූ නිලයන් ඇතුළු සියළු දෙනාම දැඩි අනාරක්ෂිත තත්ත්වයකට ද පත් වෙමින් මහජන පීඩාවක් ඇති බවත් ය. එමෙන්ම අදාල වාර්තා කිරීම සලකා බැලීමේදී විශාල ජන ඒකරාශිවීමක් සහිතව මාර්ගයන් අහුරමින් සිය මාර්ගයන් හි පදික වේදිකාව සහ වාහන ගමන් ගන්නා මාවත් ඇතුළු සම්පූර්ණ ප්‍රදේශය අහුරමින් ගමන් කිරීමට අවසර දුනහොත් ඉහත පරිදි වන මහජන පීඩාවන් මෙන්ම වර්තමානයේ දී පෙබරවාරි 04 වන දිනට නියමිත නිදහස් උත්සවය ආශ්‍රිත පුහුණුවීම් සහ ආරක්ෂක විධිවිධාන කටයුතු හේතුවෙන් ඒ උදෙසා කොළඹ කලාපයේ ආරක්ෂාව සපයන පොලිස් නිලධාරීන්, හමුදා නිලධාරීන් ඇතුළු සිවිල් ආරක්ෂාව උදෙසා වගකියන නිලධාරීන් ස්ථානගත කොට ඇති එකී රාජකාරී වලින් කඩිනමින් ගෙන්වා ගැනීමේ අපහසුතා ඇති බවත්, දැඩි අනාරක්ෂිත පරිසරයක් ද නිර්මාණය වනු ඇති බවටත් කරුණු ඉදිරිපත් කොට ඇත.

ඉහතින් දැක්වූ ස්ථානයන් අවට උද්ඝෝෂකයන්ට බාධාවකින් තොරව ගමන් කිරීමට ලබා දුනහොත් ඒ මත ඇති විය හැකි ප්‍රතිඵල තවදුරටත් විස්තර කරමින් බී වාර්තාව දක්වා ඇති පූර්ව සිද්ධීන් පිළිබඳව ද අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කොට ඇති අතර, එකී පූර්ව සිදුවීම් සමහ ද ගෙන සලකා බැලීමේ දී, වග උත්තරකරුවන් ලෙස නම් කර ඇති උද්ඝෝෂණ සහ පෙළපාළි සංවිධානය කරන අයවලුන් සිය අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය භාවිතා කිරීම සාමකාමීව සිදු කරනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි අතර, පාලනය කරගත නොහැකි ජන ඒකරාශී වීම පාලනයකින් තොරව පෙලපාලි ලෙස ගමන් කිරීමෙන් සම්පූර්ණයෙන් ම පළාතේ දෛනික කියාවලිය අඩාල කරමින් මහජනතාවට බාධා කරමින් ක්‍රියා කරනු ඇති බව පෙනී යන අතර, පොලිස් ආඥා පනත සහ අදාළ නීතිවලට අනුව ඔවුන් හැසිරවීමට සහ පාලනයට උත්සාහ ගතහොත්

CamScanner

ඔවුන් ඒ සඳහා අවනත භාවයිකින් යුතුව ක්‍රියා නොකරන බවටත්, දැඩි ලෙස කළහකාරිව ක්‍රියා කරන බවටත්, ඔවුන්ගේ පූර්ව ක්‍රියා කලාපයන් අනුව ඇති බවටත් සැලකිය යුතු අතර, මන්ද ඔවුන්ගේ පූර්ව ක්‍රියා කලාපයන් අනුව එකී තත්ත්වයන් බැහැර කළ නොහැක. මෙම සියළු තත්ත්වයන් එක්ව ගෙන බැලිමේ දී අද දින මෙම අයැදිම සමඟ ප්‍රශ්නගත වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 ව්‍යවස්ථාව යටතේ මෙම රටෙහි මහජනතාව වෙත ගෞරවනිය ව ස්ථාපිත කොට ඇති මූලික අයිතිවාසිකමක් ලෙස පුරවැසියන්ට භුක්තිවිදිමට හිමිකම් ඇති රැස්විමේ සහ භාෂණයේ නිදහස තහවුරු කිරිමේ අයිතිය බවත් පෙනී යන අතර, කෙසේ නමුත් පුරවැසියන් එකී මූලික අයිතිවාසිකම භුක්ති විදිමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 (7) වගන්තිය යටතේ දක්වන සිමාවන්ට අවනතව භාවිතා කළ යුතුව බව ස්ථාපිත නිති තත්ත්වයයි. එම අයිතිවාසිකම භාවිතා කරන අයවලුන් හට පවතින එකී සිමාව කෙරෙහි සලකා බැලිමේදී ඔවුන් නිසි අවධානය, දැනුම නොමැතිව ක්‍රියා කරයි නම් සහ පාලනයකින් තොරව ක්‍රියා කරයි නම් ඉනික්බිතව පාලනයකින් තොර ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන් නිති විරෝධි රැස්විමක් බවට පත්වෙමින් මහජන සාමයට බාධා ගෙන දෙමින් මහජන පිඩාවන් ඇති විය හැකි බව බැහැර කළ නොහැකි අතර, එමෙන්ම එකී අයිවාසිකම් භුක්ති විදිම උදෙසා නිදහසේ මාර්ගයන් භාවිතා කිරිමට නිදහස ඇති මහජනතාවගේ මහා මාර්ගයන් සවස් කාලයේ සම්පූර්ණ ලෙස අහුරාලමින් ක්‍රියා කිරිමට ද ඔවුන්ට හැකියාවක් නොමැති අතර, ඉතා අත්‍යාසන්නයේ දී සිදුවිමට නියමිත මෙම තත්ත්වයන් පාලනය නොකොට එකී තත්ත්වය උද්ගත විමෙන් පසු ලබා දෙන අධිකරණ නියෝගයක ප්‍රතිඵලයක් නොමැත. ඒ අනුව මරදාන පොලිස් ස්ථානාධිපතිගේ ඉල්ලිමට පහත පරදි වැඩිදුරටත් වගඋත්තරකරුවන් වෙත නියෝග නිකුත් කරනු ලබන අතර, එකී නියෝගයන් ට හේතු ඉහත දැක්වූ පරිදි ය.

ආණ්ඩුක්‍රම වළවස්ථාවේ 14 වන ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කොට ලබා දී ඇති මූලික මිනිස් අයිතිවාසිකම් අතර ඇති රැස්විමේ සහ භාෂණයේ නිදහස භාවිතා කරන අවස්ථාවන් ලෙසට සැළකිය හැකි ශිෂ්‍ය ක්‍රියාකාරීන්, සිවිල් ක්‍රියාකාරීන්, දේශපාලනික මතධාරීන්ගේ හෝ ඕනෑම ආකාරක මහජනතාවගේ සාමකාමී උද්ඝෝෂණයෙන් සෙසු අයගේ අයිතිවාසිකම් පිළිබඳව නිසි අවධානයෙන් යුතුව සිදු කරන ලබන සාමකාමී උද්ඝෝෂණ සහ මාර්ගයන් අහුරාලමින් සිදු නොකරන සාමකාමී පෙළපාලි මෙම අධිකරණය මහජන පිඩාව යන ශිර්ෂය යටතේ වැළැක්විමට හෝ පාලනය කිරිමට හැකියාවක් නොමැත්තා සේම එසේ සිදු නොකරනු ලබයි. නමුත් ඉහත විස්තර කොට ඇති පරිදි ලිප්ටන් වටරවුම, ඩීන්ස් පාර, ටී.බී ජයා මාවත

මරදාන හංදිය ඔස්සේ එල්ෆස්ටන් ඉදිරිපිටින් ,ටෙක්නිකල් හංදිය දක්වා පැමිණ ඔල්කට් මාවත දක්වා ද, P.D. සිරිසේන ක්‍රිඩාංගනයේ රුස්ව් මරදාන පොලිස් වසමේ පංචිකාවත්ත වට රවුමට, සංඝරාජ මාවත, ටෙක්නිකල් හංදිය ඔස්සේ ඔල්කට් මාවත ඔස්සේ කොළඹ කොටුව මුදල් අමාත්‍යාංශය දක්වා වූ මෙම අධිකරණයේ බල සීමාව තුළ මාර්ග හා පදික වේදිකා සාමාන්‍ය මහජනතාවට එනම් සවස් කාලයේ රැකියාව අවසන්ව නිවෙස් බලා සිය වාහන වලින් සහ පා ගමනින් යන මහජනතාවට භාවිතා කළ නොමැකි ලෙස අහුරමින් සිදු කරන විරෝධතා පාගමන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106 වගන්තිය යටතේ යමින් 2024.01.30 වන දින පැය 12.00 සිට 20224.01.31 වන දින පැය 10.00 දක්වා තහනම් කරමින් මෙකී තහනම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් පාර්ලිමේන්තු මන්ත්‍රී සජිත් ප්‍රේමදාස, පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බංඩාර, පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. මරික්කාර්, පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂිම්, පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා, පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් ෆොන්සේකා, පාර්ලිමේන්තු මන්ත්‍රී ජේසී අලවතුවල, පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක, පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුජීව සේරසිංහ, පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක අබේසිංහ, සමගි ඒකාබද්ධ වෘත්තිය සමිති කැඳවුම්කරු ආනන්ද පලිත, පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ, පාර්ලිමේන්තු මන්ත්‍රී කාවින්ද ජයවර්ධන, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුලු විරෝධතාව සඳහා සහභාගී වන විරෝධතාකරුවන් සහ ඔවුන්ගේ සියළු ආකාරයේ නියෝජිතයන්ට තහනම් කරනු ලබන අතර, එකී තහනම ඔවුන් වෙත දැනුම් දීමට නියෝග කරමි.

කෙසේ වෙතත් අදාල විරෝධතාකරුවන්ට සිය භාෂණයේ නිදහස භාවිතා කිරිම උදෙසා කිසිදු බාධාවක් සිදු නොකරමින් ඔවුන්ගේ මතයන් ප්‍රකාශ කිරිම සඳහා මෙම අධිකරණ බලප්‍රදේශයට අයත් P.D. සිරිසේන ක්‍රිඩාංගනය හා හයිඩ්පාක් පිටිය සුරක්ෂිත ලෙස ඔවුන් වෙනුවෙන් වෙන් කොට තැබීමටත් එම පිටි තුළ විරෝධතා දැක්වීමට බාධාවක් සිදු නොවුන ඇති බවත්, ඒ සඳහා අවසර ලබා දෙන බවටත් විරෝධතාකරුවන්ගේ පෙර දැක්වූ ඉහළ සාමාජිකයන් සහ සියළු ආකාරයේ නියෝජිතයන්ට දැනුම් දීමට නියෝග කරමි.

(ලෝචනි අබේවික්‍රම වීරසිංහ)

මහේස්ත්‍රාත් - මාලිගාකන්ද.

2024.01.30

මහේස්ත්‍රාත
මහේස්ත්‍රාත් අධිකරණය
මාලිගාකන්ද, කොළඹ 10

CamScanner